# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1980 අංක 49 දරන
# ප්‍රාථමික අධිකරණ නඩු විධාන
# (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1980 දෙසැම්බර් මස 9 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

---

1980 දෙසැම්බර් මස 12 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබා ගත හැක

මිල: ශත 20 යි. තැපැල් ගාස්තුව: ශත 50 යි.

# 1980 අංක 49 දරන ප්‍රාථමික අධිකරණ නඩු විධාන (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1980 දෙසැම්බර් මස 9 වන දින]

එල්. ඩී.—ඕ. 83/79.

## 1979 අංක 44 දරන ප්‍රාථමික අධිකරණ නඩු විධාන පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

ලුහුඬු නාමය.

1. මේ පනත 1980 අංක 49 දරන ප්‍රාථමික අධිකරණ නඩු විධාන (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

1979 අංක 44 දරන පනතේ 64 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1979 අංක 44 දරන ප්‍රාථමික අධිකරණ නඩු විධාන පනතේ 64 වන වගන්තිය මෙයින් ඉවත් කොට, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :—

"සිවිල් නඩුවල මුද්දර ගාස්තු.

64. ප්‍රාථමික අධිකරණයක පවරනු ලබන සිවිල් නඩුවක දී ඉදිරිපත් කරනු ලබන සියලු ලේඛන, මුද්දර ආඥාපනත යටතේ වූ මුද්දර ගාස්තු ගෙවීමෙන් නිදහස් විය යුතු ය :

එසේ වුව ද එවැනි නඩුවක දී, අවස්ථාවෝචිත පරිදි, පැමිණිලිකරුගේ පැමිණිල්ලට ද විත්තිකරුගේ උත්තරයට ද විත්තිකරුගේ හරස් ඉල්ලීම පිළිබඳ ව පැමිණිලිකරුගේ පිළිතුරට ද රුපියල් එකක වටිනාකම ඇති මුද්දරයක් ඇලවිය යුතුය.".

අතීතයට බලපෑම යනාදිය.

3. (1) මේ පනතේ 2 වන වගන්තියෙන් ප්‍රධාන ප්‍රඥප්තියට කරන ලද සංශෝධනය, ඒ ප්‍රඥප්තිය ක්‍රියාත්මක වූ දිනයෙහි බලාත්මක වූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(2) ප්‍රාථමික අධිකරණයක පවරන ලද සිවිල් නඩුවක දී ඉදිරිපත් කරන ලද, පැමිණිලිකරුවකුගේ පැමිණිල්ලක්, විත්තිකරුවකුගේ උත්තරයක් සහ විත්තිකරුවකුගේ හරස් ඉල්ලීම පිළිබඳව පැමිණිලිකරුගේ පිළිතුරක් නොවන යම් ලේඛනයක් මත යම් තැනැත්තකු විසින් මේ පනත ආරම්භ වන දිනයට පෙර මුද්දර ගාස්තු කිසිවක් ගෙවා ඇති අවස්ථාවක, ඒ මුද්දර ගාස්තු කිසිවක් ආපසු ලබා ගැනීමේ හිමිකම ඒ තැනැත්තාට නොතිබිය යුතු ය.

ඒ 51465—8,925 (80/09)

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිල (දේශීය) රු. 30 කි. (විදේශීය) රු. 40 කි. කොළඹ 1. තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත හැම වර්ෂයකම දෙසැම්බර් මස 15 වනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය. මුදල් ගෙවූ දිනට කලින් නිකුත් කරන ලද පනත් කෙටුම්පත් සහ නීති නොසැපයීමේ කොන්දේසිය මත ප්‍රමාද දායක මුදල් භාරගනු ලැබේ.